සත්තහාරියෝ-අතින් ගෙණ යා හැක්කාවූ; **සො සූපෝ**-ඒ සූපය; **තස්ස තස්ස**-ආහාරයාගේ; **චතුත්ථභාගපමාණෝ**-සතර වැනි කොඨාසය පමණ වූයේ; **වට්ටති**-වටී. **තතො හි**-ඒ ආහාරය

සමබඩ වූ සතර වැනි කොඨාසයෙන්; **අධිකං**-අධික කොට; **ගණ්හනත්ථාය**-ගන්නාහට; **තස්මිං රසරසෙ**-ඒ රසරසයෙහි ද; රසරසෙ ද වටී යෙති යනු **විනයසන්‍ය** හි. රසරස යනු සූපය තබා අවශෙෂයට නම්. **අනාපත්ති** හි. **ඤාතකපවාරිතානං**-නෑපෑවරුවන්ගේ සූප අධික කොට ගන්නාහට ද; **අනාපත්ති** හි.

සමපුණ්ණං-පිරුණු; **සමභරිතං**-මුවවිවින් යටැ රෙඛාව හා සම කොටැ පුරණලද්දුවූ; **අනතිරිත්තකමිච්ඡා**-නො ඉක්මවා; **රචිතං**-වක්කරණ ලද්දේ පිළිගන්නට වටී. **අනධිට්ඨානූපගෙන පන පත්තෙන**-අධිඨානූපග නො වන්නාවූ පාත්‍රයෙහි; **යාවකාලිකං**-යාවකාලිකය ථූපික කොට ගන්නාහට ද; **යාමකාලිකාදිනි**-යාමකාලිකාදීන්; **යත්ථ කත්ථචි**-අධිඨානූපග වූ හෝ නො වූ හෝ යම් කිසි පාත්‍රයෙක්හි; **ථූපිකතානිපි**[1]-ථූපිකත වූවාහුදු වටිත්. **යං පන** භොජනං යුතන්; **විසුං පත්තෙසු ගහෙත්වා**-පාත්‍රයන් දෙදෙනකුන් ගෙණැ ගොස්; **එකං පූරෙත්වා**-දෙපයැ බත් එක් පයෙකැ පුරා; **විහාරං ආහරති**-විහාරයට ගෙණැ යේ ද; ඕහට අනාපත්ති හි. **තනුකකාල වතංසක**-තකුල්වැලයන් මැ;ආදිශබ්දයෙන් පුපඵවතංසක කටුක ඵලාදි වතංසක ගතයුතු. **තනුකකාල**-තකුල්; **වතංසක**-පස්කැන්, මුදුන්මල්[2].

තත්ථ තත්ථ-ඒ ඒ තන්හි; **ඔඩිං අකත්වා**-හිරි නො දක්වා; **අනුපවිපාවියා**-තමාදිසායෙන් පතතින්; **ආකිරනෙනා**-වත් කරන්නේ; **තතො තතො**-ඒ ඒ තැනින්; **ඔමසති**-අ වො (ද?); **තස්ස**-ඔහට ද; **උත්තරිභඞ්ගෙ ච**-උත්තරිං භඤ්ජිතබ්බා= උත්තරිභඞ්ගෙ; **මාළුයෙහි** ද; **උපපවිපාවියා**-උත්පරිපාටියෙන්; **ගණ්හනත්ථාය**-ගන්නාහට ද;

වෙමජ්ඣතොති අත්ථො-මුදුනෙනැ යන අර්ථ හි. **පරිත්තකෙ සෙසෙ**-වලදු ශෙෂ වැ ගිය දෙය; **එකතො සංඛඩිත්වා**-එක් කොටැ ඇදැ; **ඔමද්දිත්වා**-මැඩැ;

සත්ත-යම් භික්ෂුවක්හට;**මාසාභතසමයාදිසු**-රජදරුවන් විසින් මවජ්මංස නො මරන්නෙ නොකන්නෙ යනාදි සමයෙහි සඟවා වලදන්නාහට ද අනාපත්ති හි. හවුරුද්දකට දෙමසකට තුන් මසකට යැ යි නියම කොටැ සතුන් නො මරන්නට බෙර පියෝ කිරීම **මාසාභතසමය** නම් වෙ. ආදිශබ්දයෙන් කාල නියමය නො කොටැ හැම කලැ මැ සතුන් නො මරන්නේ යැ යි සම්මතකාලය ගත යුතු.

---

1. ථූපිගතානිපි-කඞ්ඛාවිතරණී.
2. පුපඵවතංසක යනු නිය නොහයි, **තනුකකාල**-තකුල්; **වතංසක**-පස්කැන් ගත යුතුයි මුදුන්මල්-කැම්.

උජ්ඣානෙ සඤ්ඤා-කිපිසිතින් වෙන්වීමයෙහි ලා සංඥා තොමෝ; **උජ්ඣානසඤ්ඤා**-උජ්ඣානයෙහි සංඥා නම් වේ. මෙහි සඤ්ඤාශබ්දයෙන් චිත්තයා මැ ගත්හු. **සා සඤ්ඤා, අසා**-මේ භික්ෂුහට; **උජ්ඣානසඤ්ඤී**-මහණතෙමේ උජ්ඣානසඤ්ඤී නම් වේ.

මසුරණ්ඩය අතිමහන්ත යැ යි කී හෙයින් නො වවනේ යැ යි හැඟේ. **තෙසං**-ඔවුන් දෙදෙනාගේ; **වෙමජ්ඣිමප්පමාණං**-මධ්‍යමප්‍රමාණ කොටැ ආලොපය හෙණැ වලඳන් වටී. **එල** නම් කරඹ ආදි ක්ෂුද්‍රඵල යි. **අථල** නම් පනස ලබුජ ආදි වූ මහාඵල යි.

යත්තකෙන-යම් පමණ දෙයක් මුඛයෙහි තුබූකලැ; **වචනං අපරිපූණ්ණං හොති**-වචනය අපරිපූර්ණ වේ ද; **තත්තකෙ සති**-ඒ පමණ දෙයක් මුඛයෙහි ඇතිකල්හි; **කථෙන්තස්ස**-බණන් තාහට; **ආපත්ති**-දුක්කටාපත්ති වෙ.

පිණ්ඩං-ආලොපය; **උක්කිපිත්වා උක්කිපිත්වා**-දම් දමාලා;

කබලං-ආලොපය; **අවච්ඡින්දිත්වා අවච්ඡින්දිත්වා**-සිදැ සිදැ ගෙණැ;

මක්කටො විය-වඳුරකු සෙයින්; **ගණ්ඩ කත්වා**-කපාල යෙහි කොටැ; **එලාඵලමත්තෙන අනාපත්ති** යි යැමෙන් උත්තරිභඞ්ගයෙහි ආපත්ති යි.

භත්තං නිබ්බත්තිත්වා නිබ්බත්තිත්වා-අත සල සලා;

සිත්ථානි අවකිරිත්වා අවකිරිත්වා-හුළු වහුරුව වහුරුවා; **ඡඩ්ඩියතීති**[1]-දමනු ලැබේ නු යි යන; **ඉදං**-මේ; **අනාපත්තියං**-අනාපත්තිවාරයෙහි ලා; **අධික්කං**-අධික යි.

ජිව්හං නිච්චාරෙත්වා නිච්චාරෙත්වා-දිව නෙර නෙරා;

භත්තං නිල්ලෙහිත්වා නිල්ලෙහිත්වා-අත ලෙවැ ලෙවැ; **හත්ථඤ්ඤෙනෙන**-වලඳන්නවු විසින්; **අඞ්ගුලිමත්තම්පි**-අඟුලිමාත්‍රය කුදු; **නිල්ලෙහිතුං**-ලෝනව; **න වට්ටති** නො වටී. යම් හෙයකින් පාත්‍ර ලෝනට නො වටී ද එහෙයින්; **අඞ්ගුලියා පි**-ඇඟිල්ලෙනුදු; **සෙත්තා**-පාත්‍රය; **න නිල්ලෙහිතබ්බා**-නො ලෙවියයුත්තේ යි. **එකඞ්ගණෙපි**-එකතොලෙකුදු; **ජිව්හාය**-දිවින්; **න නිල්ලෙහිතබ්බා**-නො ලෙවිය යුත්තේ යි. **ඔට්ඨමංසෙනි එව**-ඔෂ්ඨමාංසයෙන් මැ; **අනෙකා**-ඇතුළුවව; **පවෙසෙතුං ඉට්ඨති**-ප්‍රවෙශ කරන්නව වටී.

---

1. ඡඩ්ඩෙතීති-සාඞ්ඛ්‍යවිතරණී.

න සාමිසෙනානි එතං-න සාමිසෙන යන මේ ශික්ෂා පදය; **පවිඛකුලවසෙන**-උපාසකවරුන් පිළිකුල් කරණ විසින් පණවනලද; **තඤ්ඤා**-එසේ පිළිකුල් කොටැ පණවනලද හෙයින්; මේ ඔඛයෙහි සඛාදිග්‍රහණයෙන් මලාඅදි ගත යුතු. හෙ ද නො වටී.

පවිගහසෙන-මුව සෝධන්නාවූ මලායෙන්; **පවිඡ්ඡනානං**-පිළිගන්නවුන්ගේ; **පවිගහසෙ**-මලායෙහි; **ඡඩ්ඩති**-වත් කෙරේ ද; ඔහි **නිහරිතබා**-උපාසකවරුන්ගේ පවිත්‍ර වැ තිබෙන අතුළුගෙ ආදීන් පිටතට ගෙණ හැරිය; **ඡඩ්ඩිතේ**-දමා ද; උන්ගෙ කසළ ගොඩැ, මොලංකනැ, දියෙහි වත් කරත් දෙෂ නැති.

හොජනපටිසංයුත්තානි තිංස.

——(o)——

යං කිඤ්චි ජත්තං-පණඟචජත්ත යැ, සෙතචජත්තයැ, කිලඤ්ජ චජත්ත යැ යන ජත්‍රයන් තුන්දෙනා අතුරෙහි ලා යම් කිසි ජත්‍රයෙක්; **පාණිම්හි**-අත්ලෙහි; **අස්සාති**-මොහට තු සි හෙ තෙම; **ජත්තපාණී**-ජත්තපාණී නම් වේ. සෙතචජත්ත නම් ජිනකකුඩ සි· කිලඤ්ජඤ්ඤජත්ත නම් කඩරෙදි කලාල්කඩ ආදීන් කරණ ලද්දේ සි. **සෝ**-හෙතෙම; **තං ජත්තං**-ඒ ජත්‍රය; **අඤ්ඤං**-අනෙකෙක්; **අස්ස**-ඔහට; **සචෙ ජත්තං ධාරෙති**-ඉදින් ජත්‍රයක් ධරා ද; **පස්සෙ වා එපිත්තං**-තෙමේ මැ බිමැ සිටුවා ලා ඇල යෙහි රඳවා ගෙණැ සිටියේ නම් හෝ; **භණ්ඩනෝ අපගත මත්තෙන**-අතින් පහ වූ මාත්‍රයෙහි; **ජත්තපාණී නාම න හොති**-ජත්තපාණී නම් නො වේ.

එත්ථ-මේ ශික්ෂාපදයෙහි; **චතුහත්ථපපමාණෝ**-සතරරියනක් පමණ වූයේ; **අස්ස දණ්ඩපාණිභාවෝ පන**-මොහුගේ දණ්ඩපාණිභාවය; **ජත්තපාණිම්හි වුත්තනයෙන වෙදිතබ්බා.** යෝ කොචි දණ්ඩං පාණිම්හි අස්සාති=දණ්ඩපාණී; යං කිඤ්චි සත්ථං පාණිම්හි අස්සාති=සත්ථපාණී. මේ තුන්වන ශික්ෂාපදයෙහි දු මෙසේ මැ සි.

අසිං සන්නයහිත්වා-කඩුව බැඳැ ගෙණැ; **සීසෙ**-සිරියේ ද; **සරවිකතියා සද්ධිං සඛාපි ධනුවිකති ආවුධන්ති වෙදිතබ්බං** සි යොදනු. **සරෙන සද්ධිං ධනුං වා** සි යොදනු. ශරය හා සමඟ දුන්න ගෙණැ සිටියාහට ද හුන්නාහට ද; **ධම්මං දෙසෙතුං න වට්ටති** සි යොදනු. **සුඛඛනුං වා**-ශරය නැති වැ

දුන්න මතු අල්වා ගෙණ සිටියාහට ද හුන්නාහට ද; **සුඛසරං වා**-දුන්න නැති වැ ශරය මතු අල්වා ගෙණ හුන්නාහට ද සිටියාහට ද; **සජ්ජිඝඛනුං වා**[1]-නාඟු දුන්න ද; **නිජ්ජියඛනුං වා**-නො නාඟු දුන්න ද; **ගහෙඛා සිතස්ස වා නිසින්නස්ස වා ඛමෙඛා දෙසෙතුං න වටතති. ඛණ්ඩෙ පටිමුකතකං හොති**-කරු බහා ලන ලදුයේ වේ ද; **පටිමුකතකං**-එල්වන ලදියෙ යි. **යාව න ගණ්හාති**-එසේ කරු බහා ලූ දුන්න යම් තාක් අතින් නො ගණී ද; **තාව වටතති** ඒ තාක් ඛම්මය දෙසත් වටී.

ජතුකදණ්ඩකෙ-සැත්දඩෙහි ලා; **අඛහුලනහරිකං**-ඇඟිලි හස්ස; **අපපවෙසෙතවා**-ප්‍රවෙශ නො කොටැ; **කෙවලං**-හුදෙක්; **අකකඛතනස්ස වා**-ඇක්මුනාට වෙවයි; **නිකඛි** මැඩැ ගෙණ සිටියා හට ය යි සේයි. **පවෙසෙතවා**-ජතුකදණ්ඩයට ඇඟිලි හස්ස බහා; **ඨානවසෙන**-සිටීම් වසයෙන්; **පටිමුකතකස්ස වා**-පය ලූවාහට වේවයි; **විසඛඛිතවා**-ගලවා; මෙ සිඛයෙන් යානායෙහි හුන්නා හට බණ දෙසීම් ප්‍රතිසේෂප යැ. අටවන සිඛයෙහි හොත්ත වූ මැ ගත යුතු. එහෙයින් **අනනඛසො කතසාරඤඤපි පඤඤති භූමියමපි නිසින්නස්ස** යි කීහු.

යාය කායචි නිසින්නස්ස-යම් කිසි පලලඞ්කායෙකින් හුන්නාහට;

සමීසං පාරුතස්ස-හිස් වසා පෙරෙවියහට; ඔවැ සිඛයෙන් හිස මතු වෙළා ගෙණ සිටියා ගත්හ. මෙ සිඛයෙන් සෙසු ශරීරය හා එක් කොටැ හිස් වසා පෙරෙවිය ගත්හු.

ඉමාශබදය භූම්පඨිය හෙයින් **භූමියං නිසිනොනන** යි කීහු.

සමඛුරෙන-විසයක් සේ සම වැ යන්නාහට ද;

සකටමගගසමීං-ශකටය ගිය හිරෙහි; **හරිතඝඛානමෙව**-හරිත නම් මැ[2]වේ; **අපපහරිතඨානෙති අහරිතඨානෙ**; **තිණඤඡුපකං වා**-තණසුඹුළුවක් හෝ; **පලාලඤඡුපකං වා**-පිදුරු සුඹුළුවක් හෝ; **සිඛානිකා**-මූකුණු;

සමුඤඤදි යන ආදිශබදයෙන් පරිඛාදිජලය ගත්හු. මෙ හැම සෙඛිය අනාදරයෙන් අවදනා හෙයින් **ලොකවජ්ජ**[3] මැ වේ.

සෙඛියා.

---

1. සජ්ජියඛනුං වා-හැම. 2, හරිතකො සමණවා—කැම. 3. ලොකවජ්ජ-හැම.

අධිකරණානි යනු ශුඛකතීෘ ගි. අනුකූල කෙරෙන් විතීයා මැ වී. **සමෙනති** යනු ප්‍රයොජක ගි. **ආපත්තාධිකරණසඛ්‍යා නාසු**-ආපත්තිඅධිකරණසඛ්‍යාත වූ ද; **අවසෙසාධිකරණත්තය පවවයාසු** ච-අවශෙෂඅධිකරණත්‍රයය ප්‍රත්‍යය කොට ඇති; **ආපත්තිසු**-ආපත්තියෙහි ද; **ආපත්තියෙව=ආපත්තාධිකරණං**; **එස නයො සබ්බත්ථ**. අධික්‍රියතෙ ඉති=අධිකරණං; **සම්ථෙපථං චෙව වූපසමනඤ්ච** යනු එකාර්ථ ගි. **කත්‍රාති අධිකරණ සමථෙසු**; දිඝිඅාජීවවිපත්ති ඇැ ගි කිසි ආපත්තියක් නැත ද උපවාර කෙරෙන් තන්මූලක **ආපත්ති** මැ ගත යුතු. **අනුවාදෙති උපවාදෙ**; **උප වාදනා** වොදනා එව; **අනුවදනාති ආකාරනිදස්සනමෙතං. උප වාදනාති** අපො. **සඞ්ඝසාති සඞ්ඝස්ස**; **සංඝස්ස කිච්චතතා කරණී යත්තා අපලොකනාදීනි චත්තාරි කිච්චානි කිච්චාධිකරණං නාම. අපලොකනකම්මාදිකිච්චනති විඤ්ඤත්තිසමුට්ඨාපකචිත්තං** අධිපෙතං යනු **වජ්ජබුද්ධි** ගි. යො පාපුස්සන්නතාය පාපියො පුග්ග ලො තස්ස කත්තබ්බතො **තස්සපාපියසිකාකම්මනති වුච්චති. තත්ථවාති** ගතඤ්ඤෙ. **සඞ්ඝසම්මුඛතාති** ආදිසු යාවතිකා භික්ඛු කම්මප්පත්තා තෙ ආගතා හොන්ති ඡන්දාරහානං ඡන්දෙ ආහටා හොති සම්මුඛීභූතා න පටික්කොසන්තීති අයං **තත්ථ සඞ්ඝසම්මු ඛතා**. කා ච තත්ථ ධම්මසම්මුඛතා විනයසම්මුඛතා? යෙන ධම්මෙන යෙන විනයෙන යෙන සත්ථුසාසනෙන තං **අධිකරණං** වූපසම්මති අයං තත්ථ ධම්මසම්මුඛතා විනයසම්මුඛතා. **යෙ ච විවදන්ති යෙන ච විවදන්ති තෙසං අත්තපච්චත්ථිකානං සම්මුඛීභාවෙ පුග්ගල සම්මුඛතා** යනු පෙළ ගි. **යෙ ච විවදන්ති**-යමෙක් විවාද කෙරේ ද; **යෙන ච විවදන්ති**-යමක්හු හා විවාද කෙරේ ද; **පඤ්චඞ්ග සමන්නාගතං භික්ඛුං**-න ඡන්දගතිං ගච්ඡති, න දොසාගතිං ගච්ඡති, න මොහාගතිං ගච්ඡති, න භයාගතිං ගච්ඡති, ගහිතාගහිතං ජානාති යි කියනලද පඤ්චාඞ්ගයෙන් යුක්ත භික්ෂුවක්හු; **ගුළහකසලාක ගාහ** නම් ධම්මවාදී ලභපත් ද අධම්මවාදී ලභපත් ද වෙන් කොටැ සිවුරු කණැ එවැ ගෙණැ පුහුලන් කරා වෙන වෙන එළඹැ ලභපත් වෙන් වෙන් කොටැ පැ 'මින් රිසියෙන ලභපතක් ගන්ව' යි රහසින් කියා ගැන්වීම්. **විවටක** නම් ධම්මවාදීන් බහුතර සේ දැකැ හැමදෙනා ගන්නා සේ දැකැ හැමදෙනා දන්නා සේ ගැන් වීම්. **සකණණජප්පක** නම් මෙසේ මැ බුමුනා කියා ගැන්වීම් යනු නිස්සන්දෙහ ගි. ගාහකනති ආදිසු අලජ්ජුස්සන්නාය පරිසාය ගුළකකො සලාකග්ගාහො කාතබ්බො, ලජ්ජුස්සන්නාය විවටකො, බාලුස්සන්නාය සකණණජප්පකො යනු අටුවා ගි. **ධම්මවාදීනං යෙභුය්‍යතාණානි** එත්ථ එකෙකාපි අධිකතා යෙභුය්‍යතාව. කො පන

වාදෙ වීහි තීහි? **අස්සාමණකෙ අජ්ඣාචාරෙ**-මහණහට සරුප් නො වන ව්‍යතික්‍රම කළ කල්හි; පරිවාසාදි වූ යාවනාසඞ්ඛ්‍යාත ප්‍රතිඥවට; **භික්ඛුහි චොදියමානෙ වා** යන්නෙහි වාශබ්ද එව කාරථී ඝ. **පාරාජිකාසාමඤ්ඤන්න වාති** එත්-

"දුකකවං පඨමස්සෙව සාමඤ්ඤමිති වණ්ණිතං,
සෙසානං පන තිණ්ණන්නං-ථුල්ලච්චයමුදීරිතං" යි

කියනලද සාමඤ්ඤාපත්තියෙන් හෝ; පාරාජිකසාමඤ්ඤන්න වා-පාරාජිකවර්‍යායෙන් හෝ; **සිඤ්චිති** කදුවි; අථවා, **එකතොඤ්ඤන**-අවශ්‍යයෙන්; **කකඛළඤ්ඤාය වාළඤ්ඤාඅාති** කකඛළභාවාය වෙව වාළභාවාය ච; **වාළඤ්ඤති** වණ්ඩං; **කකඛළඤ්ඤති** අඵෙජ්ජං; **ථුල්ලච්චජ්ඣත්තති** පාරාජිකඤ්ඤව සඞ්ඝාදිසෙසඤ්ඤව. **ගිහිපටිසංයුත්තන්ති** ගිහීනං ඛාසනවමහානධම්මිකපටිසඤ්ඤ ආපත්තිං ආපත්තිං යනු අථවා යි.

අධිකරණසමථා.

පඛංසිනාය-බලාත්කාරයෙන් නසනලද මෙහෙණට; **උභය** ශබ්දය උභයිවපසීාය යි. **අවසුකස්ස ප්‍රුතිඝප්‍රුත්තලස්ස**-කායසංසර්ග රාගයෙන් තෙත් වැ ගියාවූ පුරුෂයාගේ; **උභයජානුමණ්ඩලිකා නාම පාරාජිකා**-උභයජානුමණ්ඩලිකා යැ යන නම් ඇත්තී යැ යි සේයි. **චොදෙත්වා සාරෙත්වා** යනු **උත්තිත්තං** යන්නට සම්බන්ධ යි. **කරණං** යන්නට නො වේ. **චොදෙත්වා සාරෙත්වා කරණමෙව** යන්නෙහි **කරණං** යන්නෙන් **ඝතනිඅනුඝාවන** සම්පත්තිවා වෙත්. **ථුල්ලොකාසං අනතික්කමිත්වාපි** යන්නෙහි අපි ශබ්දය සම්භාවනා යි.

එකතොඅවස්සෙ යන්නෙහි භික්ඛුණියගේ මැ එකතොඅවස්සවය ගතයුතු යි. කො පන වාදෙ වීහි තීහි? **යකඛපෙතපණ්ඩක** යන්නෙහි **පණ්ඩකග්‍රහණයෙන්** පණ්ඩකයන් පස්දෙනා ද උභතොව්‍යඤ්ජනකයා ද ගත්හු.

ලොකස්සාදමිත්තඝණ්ඨවඝෙන - කාමාස්වාදමිත්‍රසංස්තව විසින්; තං දස්සෙතුං **කාඝඝංඝගතරාගෙනාති** වුත්තං.

පාරාජිකකණ්ඩං.

අවඅකරණඤ්ඤාඝ-යුකති බණනු පිණිස; **භික්ඛුනිඝඞ්ඝතොනිස්සාරෙතීති** එත්ථ න හි සො ධම්මො සඞ්ඝමහා තොනවි නිස්සාරියති. තෙන පන ධම්මෙන භික්ඛුනී නිස්සාරියති තස්මා සො

නිස්සාරෙතීති=නිස්සාරණීයෝ; තං නිස්සාරණීයං. නෙරනි යන; ආපත්ති නිස්සාරණීයහෙතුත්තා නිස්සාරණීයාති වුත්තා. **යථා හථා**-පූජේතුකාම යම් කිසි ප්‍රකාරයෙකින්;

පඤ්චමං.

යාඝ-යමක විසින්; **භවවිඝ්නනඝණ** නම් කුමාරභත්තිගණය යි. කුමාරවරුන් රක්ෂා කරණ කුඩා සෙවොවෝ ලු. සෙස්ස **සන්‍යෙයෙහි** කී පරිද්දෙන් දත යුතු.

වොරිවුඤ්ඡනයෙහි උපාධ්‍යායකම් කරන්නියට ආපත්ති යි. අනෙකක් කරවත් කොත් අනාණත්තිකහෙයින් දෙෂ නැති වැ හැගේ. අවත්‍යතික්‍රමිතව්‍යඤ්ච ව්‍යතික්‍රම දැනැ පණත් නො දැනැ කරණ පක්ෂයෙහි යි.

දුතියං.

ඔක්කන්තනති යන්නෙහි අවී අතිකෙකනෙත යි දතයුතු. අජෙඩ්කාකාසයෙහි **දසසනූපවාරය** කරණව දූරෙපි **දසසනූපවාරෙ** කොනි යි යනාදි කීහු. දසසනූපවාරය ගම මැ යැ. සවණූපවාරය අජෙඩ්කාකාසයෙහි මැ යි.

බුඩවරෙන-බුඩවරයා විසින්; ශික්ෂාපදයෝ වණීණිතයහ. ඔහු කවරහ?යත්.-**චතුරෙ සඩ්ඝාදිසෙසා** හවෙයූනූ-සඩ්ඝාදිසෙසා පත්තීහු සතරදෙනෙක් වන්නාහ. **නෙ සඩ්ඝ එකපඝොසණාය ආපජෙජය්‍ය. එකතෙ භාවෙ** යනු අසඩ්ඛ්‍ය හෙයින් හුදකලා වැ යැ යි අවී ගත යුතු.

තතියං.

ආපත්ති හෙයින් නො දක්නා බව යි **ආපත්තියා අදසසන** නම්. **ථුල්ලවවසනති** වීහෙව එකං ථුල්ලවවයං. **ඤතිං ඤාතිඩා-පවත්තා** ලෙසින් අභිප්‍රාය දැනැ;

චතුත්ථං.

තතථ පන-ඒ යකඩාදීන් අතින් පිළිගැන්මෙහි; **සඩ්ඝසථ ව-ගහණාදීසු**; පටිග්ගහණ පරිභොග හැම තන්හි.

පඤ්චමං.

නෙසනති උදකදනතපොනානං; පුන **නෙසනති** අවසෙසා භාරානං.

ඡඨං.

චතුන්න අඛෙහන්නන්ති සඞ්ඝභෙදසික්ඛාපදෙ වුත්තඅඛෙහන්න; තෙසු පඨමං අඞ්ගං **අපනෙත්වා** එවං වචනසඞ්ඛාතං පඨමං අඞ්ගං; **නානන්ති** බහිබා භික්ඛුනීනං.

දසමං. **එකාදසමං.**

කොටවන-ගිහීනට පැරිම්. ඔවුනට මැ පවනාදි කිරීමෙන් ගිහින් හා **මිත්තසන්ථවා**. මිථ්‍යාජීවය (**පාපයි**) **ලොක** නම්.

බාදසමං.

සමනුභඤ්ඤා-සමනුභාසනාකම්ම කරණලද්දී; **බලවභාසභා වෙන**-බලවත් තෙපුල් ඇතිබැවින්; **බලපක්කාසනභාවමුත්‍රාසනෙන**-තමන්ගේ ශක්ති භගවන්නාවූ උරණිතැ යන අජ්ජි යි. හෙවත් **සමුත්‍රාසනෙන**-භයපත් කැරැවීමෙන්; **සබ්බපඨ සමුච්චයපඨොති** සබ්බපදෙසු උකුසුය ච පරිභවෙන ච අකඛන්තියා ච දුබ්බල්‍යා වාති එවං **සමුච්චයපඨො**.

තෙරසමං.

භික්ඛුණී සඞ්ඝං න භින්දතීති සඞ්ඝභෙදෙ හි භික්ඛුසඞ්ඝස්ස භෙදවසෙන සියාති ව, භික්ඛුස්ස සඞ්ඝං භින්දිත්වා පවෙත්තකං උපොසථාදිකම්මකරණවසෙන හොතීති ව, භික්ඛුණියා සහ උපොසථාදි කරණාභාවතො ච වුත්තං. **නානති** පක්ඛමානත්තං. **නත්ථොති** යොජනාය. **එවමස්ස වචනීයොති** සඞ්ඝො එවං වචනීයො භවෙය්‍ය; **ඛමති සඞ්ඝස්ස**-සඞ්ඝයාට අභිමත යැ. **තස්මා තුණ්හී**-එහෙයින් තූෂ්ණීම්භූතයන්. **එතං**-මේ තූෂ්ණීම්භාවය; **එවං ධාරයාමි**-එසෙයින් ධරම්. පිරිසුදු වූ හෙයිනැ යි සලකම්. **වෙදියාමහං අය්‍යෙ වෙදියතීති ජානාමි, චිත්තෙන සම්පටිවිජ්ඣිත්වා සුඛං අනුභවාමි, න තපපච්චයා අහං දුක්ඛිතාති අධිප්පායොති** ලිඛිතං. **වෙදියතීති** පදෙපි එසෙව නයො. **වෙදියාමි**-දන්වම්. මෙනම් මෙනම් සිතින් පිළිගෙණැ පුරා සුව අනුභව කෙරෙම්. එ මා නත් හැසුරුණු ප්‍රත්‍යයෙන් දුකකි වන්නෙම් නොවෙම්. ඒ මානත් හැසුරුමට දුකඛයෙක් නැතැ යි දන්වම් යි සේයි. නොහොත් මානත් පුරණබව දන්වම්. ඒ මානත් පුරණබව භගව යි මා සඞ්ඝ දනීව යි යන අජ්ජි යි. **චතුන්නං භික්ඛුනියඤ්ච භික්ඛුනීනඤ්ච** යි අනතිම පඤ්ඤය ගෙණැ කීහු. **එත්ථ**-මෙ මානත් හැසිරීමෙහි.

සඞ්ඝාදිසෙසවණ්ණනා.

අධිඨහිත්වා-සිතා ගෙණැ;

පඤ්චමං.

යථා දූතෙනෙව-පෙරැ උපාසකවරු චීවරාදි යමක් උදෙසා දුන්හු ද එසේ දුන්පරිද්දෙන් මැ; අධිඨාය-කාලචීවර යැ සි සිතා ගෙණැ; ලෙඛෙන-අපගේ කඨිනාස්තරණය කළහෙ සින් කාලචීවර යැ සි මේ ලෙඛයෙන්.

දුතියං. තතියං.

යඤ්ච විඤ්ඤත්තං[1]-යමෙක් ආදි කොට චිනවන ලද ද; තතො අඤ්ඤං-එයින් අන්‍යය; සමඝඤත්තං හොති චෙ-ඉදින් සම අගනා බවක් වී නම්[2]; ඉමං ආනිසංසං-මෙ සම අගනා බව යැ සි කියනලද ආනිසංසය ගඟවා හුදක් අන්‍යය ද;

චතුත්ථං. පඤ්චමං.

අඤ්ඤස්ස අත්ථාය-චීවරාදි යමක් පිණිසැ; අඤ්ඤං උද්දිසිත්වා-චීවරාදි යමක් උදෙසා; තතො-ඒ නියමිත චීවරාදි පරිෂ්කාරයෙන්; සෙඛඛං-දායකයන් නියම කළදෙය ගෙණැ ඉතිරිය; උපනෙතබ්බා-යම් අනෙකෙකැ ළඟවන්නියට ද.

ඡට්ඨං.

සඞ්ඝං සාවිඤ්ඤෙනාපි-තමා විසින් යාචඤ්ඤ කරණලද්දාවූ; සඞ්ඝිකෙන හි සම්බන්ධ සි. ප්‍රත්‍යෙකයෙන් නො ගත යුතු. තමන් විසින් මැ සඞ්ඝයාහට ආදි කොට පැවැත්වූ හෙයින් සඞ්ඝිකෙන සඤ්ඤාවිඤ්ඤෙන හි කීයේයි. නැවත ද යොජනාවෙක් ඇති. මෙ සඞ්ඝං යාවිඤ්ඤෙනාපි යන අපි ශබ්දයෙන් එහි මැ කියනලද අඤ්ඤාදිසික සඞ්ඝිකය සමුච්චය කෙරේ. එහෙයින් අඤ්ඤාදිසික සඞ්ඝිකය ද සඤ්ඤාවිඤ්ඤත්තය ද එකක් කොට අනෙකක් පරිවර්තනය කරන්නියව දෙශ වෙ සි දත යුතු. පෙල ද යොජනාව මෙසේ මැකව යුතු. "අඤ්ඤාදත්ථිකෙන පරික්ඛාරෙන අඤ්ඤාදිසිකෙන සඞ්ඝිකෙන ච පරික්ඛාරෙන අඤ්ඤාදිසිකෙන අඤ්ඤං වෙතාපෙත්‍ය නීසඤ්ඤියං" සි යෙදිය යුතු. මෙ යොජනාව වජිරබුද්ධියෙහි කීයේ. දෙක වෙන් වෙන් කොට වෙතාපනය කළහොත් මෙ සිඛයෙන් දෙශ නො වෙ සි. සාඞ්ඝිකය යවැ සිඛයෙන් දෙශ කෙරෙයි.

1. විඤ්ඤාපිතං-සාඞ්ඛාවිතරණී. 2, ඉදින් මනා ද හෙවත් මනා වී නම්-සාරම්.

සංසාවිතය අනෙකෙකින් දෝෂ කෙරේ. මතු කියන සඤ්ඤ විකයෙහි ද මෙසේ මැ අර්ථ ගත යුතු.

සත්තමං. අට්ඨමං. නවමං. දසමං.

පඨමෝ වග්ගෝ.

——(o)——

කංසෝ නාම-කංසයෙක් නම්; චතුඝණාපණ්ඩිකෝ-සතර කඟවළුවක් අගනේ ඇි. මහඝසං වෙණාපෙතබං-මා ඇඟි දෙයක් නමා පිණිසැ පරිවර්ත්තනය කරන්නහු; අප්පඝසං වෙණා පෙතනියා-අල්පාඝීයක් විනවන්නියට;

පඨමං.

නිස්සග්ගියවණ්ණනා.

——:——

භණ්ඩිකාලසුත්ත නම් වෙ බොහෝ බික්[1] ඇති ලුහුනු මැ. න එකබිතිමිඤ්ජකං-එක්බික් දෙබික් තුන්බික් ඇති සැලුනු හෙළලුනු වේ. පලණ්ඩුකාදීන් අතුරෙහි චතුම්ඤ්ජයෙහි පවත් උඩත භණ්ඩිකාලසුත්ත නම් වේ. භඬික නම් ලුහුනුජාතිය එකබිතිමිඤ්ජක නෝ වෙ යි දත යුතු. බික් බෙහෙවැ යි සේයි. යං ගිති භණ්ඩිකං ලුසුතං; පලණ්ඩුකං-හෙළ ලුහුනෙහි; භඤ්ජනකෙ-සැලුනෙහි; හරිතකෙ-නිල්ලුහුනු නම් ලුහුනුජාතියෙහි; චාවලසුතෙ-බිජු නැති ගෙඩි මතු වූ සිව්ලුහුනු නම් ලුහුනුජාතියෙහි ද; සාලවෙ-ගිවුළුසාලවයෙහි; යෙදූ ගිවුළුයෙහි යැ යි සෙයි.

පඨමං. දුතියං.

මුතකකරණස්ස-මූත්‍ර කරණ ස්ථානයාගේ; තලසාතකෙ-මුදුන පැහැරුමෙහි ද; ආබාධපපවත්තා අනාපත්තී යි වෙන ගත යුතු.

තතියචතුත්ථපඤ්චමානි.

——:——

සුඛෙන වා උදකෙනාති තක්කාදි අම්බසකෙන වා උදකෙන;

ඡට්ඨං.

එසෙව-මෙ ශික්ෂාපදයෙහි ද;

සත්තමං.

---

1. බිඬ-ඇම.

අඹිඤවලඤඤසු-මස්ඇට කවුඇට ආදි ඇටෙහි ද බුලත් සප් උක්සප් ආදි වූ සප්හි ද;

අඨමං. නවමං.

ධම්මභාණඤගීතම්පි-ධම්මසූවකගීත ද; **උපඨානං**-බෙරපුද; **ලාභඤභත්තාදිඤඤ සති**-ලාභබත්ආදියක් ඇතිකල්හි ද; **කරණීයෙන**[1] **නහවා**-යම් කිසි කවයුත්තෙකින් ද හොස්; **සමජ්ජට්ඨානං**-නෘත්‍යගීතාදි පවත්නා ස්ථානයට; මෙහි සමජ්ජනං යන් නෙහි සමජ්ජ නම් සමග යෙදීම යැ. ඒ ස්ථානය ද උපචාර යෙනැ යි සේයි. උපචාර ගැන්මෙන් සමජ්ජඨාන නම් වෙ.

දසමං.

ලසුණාදිඤඤා.

පජ්ජාන-ප්‍රදීප[2]; **අනොභාසිනෙ**-ආලොකයක් නැති කල්හි; **සන්තිඤඤෙ ඨාතුං**[3] **සල්ලපිතුඤඤාති** භික්ඛුනියා ඨාතුං සල්ලපිතුං ව. **ගෙහසිතඤඤථනති** ගිහිගෙහනිස්සිතං කථං පටි සඤ්ඤාරවසෙනාති.

පඨමං දුතියං. තතියං.

අවිනිබ්බිඣරච්ඡායඤ[4]-ඉදුරා නො යැ හැකි මුල්ලට හොසිනුදු නැවතිය හැකි වූ තොවෙතන්හි ද; **චවවරඤඤ**-සතරමංසඤියෙහි; වීපි සිවු සඤියෙහි යැ යි සේයි. මෙ හැම මහාවීපියෙහි ද කොවෙ යෙහි ද සිවු වීපිසඤියෙහි ද යනු යි.

චතුත්ථං.

පල්ලඞ්කඤඤොකාසඤඤ ගතෙන-පල්ලඞ්කයට සැහෙනු ව අවකාශ වූ ස්ථානයෙහි; **සාමිඤඤෙති** පධානවසෙන වුත්තත්තා ආහ: **තඤඤං කුලෙ යං කිඤඤි විඤඤඤ්ඤුමනුඤඤතති. ජනතඤඤ-පෙ-අනොවඤඤං** කං අනික්කඤඤමෙනතිඤඤා යි කියා ද **අඤඤකාකාඤඤෙ නිසීදිත්වා උපචාරං අනික්කඤඤමෙනතිඤඤා** යි කියා ද සම්බන්ධ කරණු.

අසංහාරිමං-නො ගෙණැ යැහැකි හස්නෙහි ද;

පඤ්චමං. ඡඨං. සත්තමං.

---

1. කරණීයෙ-කඞ්ඛාවිතරණී. 2. ප්‍රාණිප්‍රදීප-හැම.
3. සන්තිට්ඨිතුං-කඞ්ඛාවිතරණී. 4. අනිබ්බිද්ධරච්ඡාඤ-ඇතැම්.

පර නම් උපසථාන ලද්දී ය. එහෙයින් **කිවු උපසම්පන්නං** ය. අසුසූසනාදිකං ගන්වා **අහං කිරසෙය්‍යාදිනා** වදති **උජ්ඣාපෙනතියාති** ලාමකතො චින්තාපෙනතියා.

අෂ්ටමං.

මනුස්සදුහණගන්ධ වා-මනුෂ්‍යලොකයෙහි දුර්ගන්ධබැවින් හෝ නොහොත් කණ වෙම්ව ය පිළි වෙම්ව ය යනාදි විරූප බැවින් හෝ ය. ය සේ ය.

නවමං.

කෙවලං රොදනතියා එව න වඩෙනතියා-සුනිව්‍යසනාදීන් තමා නො පැහැරූ හුදෙක් හඬන්නියට ද;

දසමං.

අඛ්ඛාරවග්ගෙනා.

පඨමං. දුතියං.

රාජවොරමනුස්සාගතිතොයවාළසිරිංඝපාමනුස්සජීවිතබ්‍රහ්මචරියන්නාරයකාති වුත්තෙනසු **දසසු අනන්තරායෙසු; කිඤ්චි න ලබභති**[1]-හු හිදිකටු ආදි වූ කිසිවක් නො ලැබේ ද;

තතියං.

සඞ්ඝසම්භෙදඤ්ච-දෙපව එක් කොටැ සිටුවාම්හියෙන්; **සඞ්ඝභෙදඤ්ච**-තනවැස්ම.

චතුත්ථං.

සඞ්ඝසමඝබඛ්බවිවරං-දිය යුතු ඇත්තවුන් කරා පැමිණ විය යුතු විවරය.

පඤ්චමං.

සමගසඞ්ගාලෙ දසසථ-දුන් පිළි නො හැනෙයි. මිල මතා වැ ගියසමයෙහි ගෙණැ දෙව ය යනාදීන් මෙසේ අනුදන්වා වළකන්නියට ද;

ඡට්ඨං.

---

1. න ලභති-සඞ්ඛාචිතරණී.

චීවරවිභඞ්ගං-සිවුරු බෙදීම.

සත්තමං.

කප්පකතං-කප්බින්දු ඔබනලද;

අට්ඨමං.

සචෙ සඞ්ඝප්පත්තා දස්සාම-ඉදින් සමඟ වූවෝ නම් දෙම්හ සි; **කිඤ්චාපි න සඞ්ඝප්පත්තානි වදන්ති**-කිසි සේත් අසමඟ වූවෝ වම්හ සි කියති. **ඉදානි**-දැන් මත්තෙහි;

නවමං.

අට්ඨාරසමූලඛණ්ඩානි-කඨිනවස්ත්‍රාරමූලකොං; සමඅධිෂ්ඨාය දීම කසි නුඩාරයට මැ සි. අකාලචීවරය වෙන මැ දෙත්.

දසමං.

නගරවිඤ්ඤත්ති.

පඨමං.

පාවාර-පිඩාම්; **අත්ථරණ**-අස්සත්ථරණ රථත්ථරණාදි ඇතිරි; **කටසාරක**-කළාල්;

දුතියං. තතියං.

සඞ්ඝං විහරතීති=**ඉධිවාසිනී**. අඤ්ඤ සමීපෙ වසතීති= **අඤ්ඤවාසිනී**. **පරියෙසිත්වා**-හෙසජ්ජාදිපයෙජ්ජභණය කොටැ;

චතුත්ථං.

සම්බාධබ්භං-දෙර ලූ.

පඤ්චමං. ඡට්ඨං.

සඤ්ඡින්න-ජබසසත්ත යැ සකටසත්ත යැ යන සාප්පයක් හා සමඟ.

සත්තමං.

එසඳ-මේ සිඛයෙහි; **නිදන්තොරතුරු** හෙයින් **රාජගහං** ගුනු.

අඤ්ඤං.

කෙනචි-කිසිවක්හු විසින්; **උඛ්ඛාලහාය වා**-නහා පියන ලද්දියට හෙවත් උපද්‍රැතවූව[1]හට ද;

නවමං.

පවවාඝවජනති-පවජා පවජා ආඝවජ්‍රන්ති. අධ්‍යනාති මගෙහන;

දසමං.

තුවටවවගෙහා.

උපඛනං-උයන; **උසභානං**-බැහැරි කෙළෙ උයන් නම්.

පඨමං.

අභාදිමෙන වාලෙන-ඇරැ හිදුවා කළ ව්‍යාඝ්‍රරූපයෙන්.

දුතියං.

අඤ්ඣිනං හොති-යම් පමණ කැවැ කැවැ අතින් එවැ ගත්තා ලද ද; **තඤ්ඤං**-ඒ අඤ්ඣිතය හෙවත් අත එවැ ගත්හු; **නඛඛාමහි වෙඨිනෙ**-හිද්දෙහි වෙළු කැරැ ඔත්කල්හි; **ඉදං හි සඤ්ඤාය**-මෙ හූකැටි හිද්දෙහි ඕනාබව සඳහා; **උජ්ජවුජ්ජවෙති වුත්තං**-කැට නහ නහා හිද්දෙහි ඔත්සඳ යැ යි කියනලදි.

කපපාඝච්චිනනං-කපු සෙවීම;

තතියං.

මානාපිතෘරු-මවුපියන් ලවා කිසි කර්මාන්තයක් තමහට නො කරවා; **මතඤං**-මාතාපිතෘන්ගෙ; **පූපගණනාඝ**-එකි එකි පූව පූප නම්. එහෙයින් පූ ගණනින්;

යාගුපානනි යාගුදානෙ; සඞ්ඝයාහට හඹු දීමෙහි ද; **තෙඝං**-ඒ මනුෂ්‍යයන්ට; **අත්තනොව වෙඨ්‍යාවච්චකරඝඝ**-ඒ තමාගේ වෙය්‍යාවච්චකරයහට ද;

චතුත්ථං. පඤ්චමං. ඡඨං.

උතුනියො භික්ඛුනියො-ඔසප් භික්ඛුනීහු; **අනිඝඝජීවා**-නො දී;

1, විවියහට, විවියනට-කැම්.

සුන පරියායෙන වා-නැවත ඔසප් වූ වාරයෙහි;

සත්තමං. අට්ඨමං.

ඵරුසිපසං-බඩගශිලප; **අථබ්බණ** නම් එකහනි(?) අශොදීන් මරා යාග කරණ සැටි කියන වෙදයෙකි. **සීලමන්ත** නම් ඵල[1] තබන මන්ත්‍රය යි. **වසීකරණ** නම් අනුන් වසඟ කරණ මන්ත්‍ර යි. **සොසාපනමන්ත්‍ර** නම් මන්ත්‍ර ජප කොට අනුන් වියලන මන්ත්‍ර යි. **අගදපපයොගාදිභෙදං**-මෙසේ මන්ත්‍ර හා බෙහෙත් යෙදීම් ආදි වූ භෙද ඇති; **පරූපඝාත කරං**-මෙරමාගේ උපඝාතය(=විනාශය)කරන්නාවූ විද්‍යාව ශූතැනි.

නවමං.

උභයම්පි-මේ ශික්ෂාපදවයය ම; යථාක්‍රමං **ඡබ්බගහියා** වෙව **සබ්බඡුලා** ව ශූහු. **ලෙඛෙ**-අක්ෂිසූචක විද්‍යායෙහි, අකුරෙහි ද හෙවත් අකුරු උගන්නා පිණිස; **ධාරණාය** ච-ධාරණ මන්ත්‍රශාස්ත්‍ර ඉගැන්මෙහි ද හෙවත් එකදවසක් එක් වේලෙක නෝ කී බිණූ දැ විවාළකලැ සමානිවෙකල්‍ය නැති වැ ධරන්නට සමර්ථ වීම් කියන ශිල්පයෙහි ද; **යඤ්ඤපරිත්තන**-යඥමන්ත්‍ර; **පරිත්තන** යනු පරිපූර්ණ වූ තා පාලනෙ ඇත ධාතු යි. **පරිත්තන**ශබ්දයෙන් මන්ත්‍ර ද කියත්. **නාගමණ්ඩල**-සර්පමන්ත්‍ර යි. **සර්පයන්** නො වදනට පිටි යෙන් මන්ත්‍ර ලියා මඬුලු බඳිත් ලු.

දසමං.

චින්තනාකාරවණ්ණනා.

සත්තං භික්ඛූං අනාපුච්ඡා යි **මාතෘකායෙහි** නො කිව ද **පදභාජනියෙහි** මෙ මැ සිඛයෙහි **අනුප්‍රඥප්තියක්** බැවින් කිහු මෙ අනුප්‍රඥප්තිදෙක්හි අනාපුච්ඡා යි ද ජානං යි ද තොරතුරු[2](?) මූත් සත්තං භික්ඛූං සභික්ඛූං යි එක් මැ යි.

සිඤානුලොකිකාති පඨමං පවිසන්තීනං සීසං අනුලොකෙන්ති;

පඨමං.

අසඤ-මේ භික්ඛූහව; **භයං උපදංසෙඤ්ඤ**-මරා පියම්හ යන්නා දීන් භය දක්වා නම්.

දුතියං.

යප්පච්චයා-යම් කිසිවෙකින්;

තතියං.

---

1. තොල, කොල යි හැම්. 2 නො තොරතුරු-ඇතම්.

නිමන්තිතා අපවාරිතා-භත්තස්ස නිමන්තිතා සයඤ්ච අපවාරිතා යාගුමපිවති, ආපුච්ඡා භුඤ්ජති වට්ටති.

චතුත්ථං.

කුලෙ මච්ඡරෝ=**කුලමච්ඡරී**. සෝ **එතිස්සා අත්ථීති වා කුලං වා මච්ඡරායති** යනු ශීලාඳී හෙයින් කිහු. **කුලං වා මච්ඡරායතීති**-කුලය හෝ මසුරු කෙරේ නු හි; **කථං නාම න මච්ඡේය්‍යුන්ති**-ඒ භික්ඛුනීහු ඒ කුලයට සෙසේ නම් නො යෙද්දේ හෝ හි;

පඤ්චමං.

සෙනාසනපඤ්ඤාපන-හෝනා හිඳිනා ඇතිරි ආදි සෙනසුන් පැණවීම්;

ඡට්ඨං.

සබ්බසඞ්ඛාතිකඤ්ඤතී-එකවාවිකවෙවාවික තෙවාවිකසමාන වසසිකයට එක්කොට හකුළුවා තබන සඳතනී හි. **නෙසජ්ජිවාති** භික්ඛුනීසඞ්ඝ එව;

සත්තමං.

අත්ථායගමනන්ති අත්ථාය අගමනං.

අට්ඨමං.

වාතුද්දසෝ උපොසථෝ හොති තෙරසෙ ගච්ඡන්ති. **ආපුච්ඡන ආසාවනාය**-ආපුච්ඡනාය ආවනායෙන් ධුරනිඤ්ඤප හි.

නවමං.

තතෝ හි-ඒ ප්‍රදෙශයෙන්; **මෙ ඌරු පහිරජ්ජිත්ථා** හතා හි සම්බන්ධ හි.

දසමං.

ආරාමවග්ගෙහා.

පඨමං.

ඤත්ති යං වුත්තං;

දුතියං.

මානනතෝ-ආදර කරණ හෙයින්;

තතියං.

උපසම්පදසම්මුතීති ඤත්තිකමෙමන සම්මුති; **සඤ්ඤා න දිනනා හොති** යි යොදනු. මතු ගිහිගතය කියන හෙයින් **ඉමා මෙථ මහාසික්ඛමානා නාම** යි කිහු.

චතුත්ථං.

ගිහිගතානති අබ්‍රහ්මචරියාය එතං අධිවචනං.

පඤ්චමං.

ඡට්ඨං. සත්තමං. අට්ඨමං. නවමං.

න වුපකාසාපෙක්ඛ-ගෙන නො යවා ද; **න ආණාපෙක්ඛ** යනු යෙහි පදපූර්ණ නො වේ.

දුනිසිකං අලභනතියා ගිලානාය-ඇය කැටි වැ යවන් නව සුදුසු දෙවන එකක නො ලබන්නියට ද;

දසමං.

ඡබ්බිනිවණෙනා.

පඨමදුතියසතතියානි ප්‍රථමවිතියතෘතීය ශික්ෂාපදයෝ; **තීණි ගිහිගතසික්ඛාපදානි සදිසානෙව**-ගිහිගත ශික්ෂාපදයන් තුන්දෙන හා යථාක්‍රමයෙන් සමානයෝ යි. **ගිහිගතා** යන් නෙහි දෙලොස් හැවිරිද්දෙහි පවත් අවලොස් හැවිරිද්ද දක්වා ගිහිගත යැ යි කිය යුත්තේ යි. අවලොස් හැවිරිද්දෙහි පවත් **ගිහිගත කුමාරීභූත** යැ යි දෙක මැ කියත් ලැබේ. **සම්මුති කම්මවාචාදිසු**-වත් පුරන්නව සම්මුති ය, උපසම්පදඤත්ති ය, කර්ම්මවාක්‍යය යන මෙහි; **අඤං පනාති** ගිහිගතා. **සා පනායං සාමණෙරී සා කුමාරීභූතාති වුතතා**. මේ කුමාරීභූතා යන් නෙහි කුමාරිකා වනාහි අවලොස්හැවිරිද්දෙහි සික්ඛාසම්මුතිය ලදින් විසිහැවිරිදිකලැ උපසම්පදා ලැබේ. මීට ඌන වුවහොත් උපසම්පදා නො අර යි දත යුතු. මෙහි ගිහිගතයා සම යැ යි කී හෙයින් අවලොස් හැවිරිද්දෙන් යටැ කුමාරීභූතත්වය නො ලැබේ.

තතියං.

දුකකවානං-දුකකවයන් දෙන්නාව අතතුරු වැ;

චතුත්ථං. පඤ්චමං.

උණානසම්මුතියා යාචිතාය-උපසම්පදාසම්මුතිය ඉල්වූ කල්හි; **නූන**-එකනෙකන; **ධිඅයාසානි** අවණණමපකාසෙය්‍ය.

ඡට්ඨං. සත්තමං.

උභයත්ථ[1]-යන ශික්ෂාපදවයයෙහි; **එවාහතං වුඤ්ඤාපෙස්සාමි** යන ප්‍රතිඥව යැ; **ආකඩ්ඪනනිපඵත්තිනි**-ප්‍රාර්ථිතවිවරයාගේ නිෂ්පත්තිය යැ.

අට්ඨමං.

සරං-තමන්ගේ ගෘහයට වදනා; **සරසාමිකා විය**-සර සවාමීන් මෙන්; **අඤ්ඤම්පි**-මේ ද; **සොකං ආවිසති ඉති**-තමා සතන්හි උපන් ශොකයට තොමෝ ම වදී නු හි; **සා ආවිසති**-යම් ශොකයකට වදී ද; **සෝ**-එ ශොකය; **අස්සා**-මව;

නවමං. දසමං.

පාරිවාසියෙන-විසුවාවූ; **උස්සාරණා වා කාසිරති**-පහ වව යනාදීන් නහා පීම හෝ කරණුලැබේ ද; එ පෂ්ඨ එතැනින් ඉගිල ගිය බව සි **පරිසපාරිවාසිය** නම්. **එකං අජ්ඣෙසනති**-එක් භික්ෂුවක්හට ආරාධනා කෙරෙද්ද; ඇණවතුදු සි කිනියා සි. **තඤ්ච**-ඒ ධර්මකථිකයා; රාත්‍රිය ඉකුත්බව සි **රත්තිපාරිවාසිය** නම්. **උපචවහා**-ඉක්මෙන්නේ සි.

එකාදසමං.

එකනනතියනති එකෙන සංවර්‍යරෙන අනන්තරාබාධිකං කවා.

වාදසමං.

එකනනතියං වුඤ්ඤාපනං **කරොනතියා** යි ක්‍රියාවිශෙෂණ කවයුතු. **එකනති** ඝිකඛමානා.

තෙරසමං.

කුමාරිභූතවත්ථුස්මා.

—(o)—

1. උභයමපි-සාඛාවිතරණී.

අපනෙත්වා[1]-හිසින් පහ කොට;

පඤ්චමං.

වයහාදිනා-සිවිගෙ ආදීන්;

දුතියං.

සඛාණ්ඩං-හිණැ පලඳනා ආභරණ සි. එහෙයින් කීහු "**සං කිඤ්චි භණ්ඩිකං**" සි. **භණ්ඩිකං**-කවිසඤ්ඤයට උපග වූ, යොග්‍ය වූ; **කවිසුත්තකං**-හිණැ පලඳනා පිරිත්නූලාදිහු සි.

සතියං.

වක්කුභණනායෙ-ව්‍යතික්‍රමගණනින්;

චතුත්ථං. පඤ්චමං.

ගන්ධවාසිතකෙන-සුවඳ ගැන්වූ; **නිලපිඤ්ඡෙන**-තලමුරුවවින්;

ඡට්ඨං.

උබ්බට්ටාපෙය්‍ය-උලවා ද; **සම්බාහාපෙය්‍ය**-මඩවා ද;

සත්තමං. අට්ඨමං. නවමං, දසමං.

අභිමුඛමෙවාති අත්ථෝ න ඉති සම්බන්ධෝ. උපචාරතෝ වාදස හත්ථා. **ඡමායපි**-සිස් බිම්හි දු;

එකාදසමං.

තත්ථ සත්ථාති සුත්තාභිධම්මාදිසු; **අනොදිස්සාති** සුත්තං වා විනයං වා අභිධම්මං වා අනොදිසස;

බාදසමං. තෙරසමං.

ජාතකවණ්ණනා.

පාචිත්තියවණ්ණනා සි.

—(o)—

---

1. අපනාමෙත්වා-සඞ්ඛාභිතරණී.

තන්‍නාති භික්ඛුනීපාතිමොක්ඛ; **සමුට්ඨානවිනිච්ඡයෝ**-ශික්ෂා පදෙහපත්තනිශ්චයය; **ගිරග්ගසමජ්ජ**-පීතයාගේ ඡායාගෘහයෙහි තැටුම්සිඛය ද; ගිරග්ගසමජ්ජං යනු නිදානවසයෙන් කීයා ය. පෙළ කෙසින් "නච්චං වා ගීතං වා දස්සනාය ගච්ඡෙය්‍ය පාචිත්තියං" යන සිඛය සි. **එත්ථ**-අවිත්තක ය අකුසලචිත්ත ය යන මෙහි; **සුබ්බ වුත්තවිනිච්ඡයනති** යෙසං මංසං කප්පති තෙසං සප්පීති වුත්තවිනිච්ඡයං;

පාලියං අනාගතෙසු පන අට්ඨසු යනු විවාරන්නට තුබූ ය. අගමහිර වූ සෙස්ස පාඨානුසාරයෙන් දත යුතු.

පාචිත්තියකණ්ඩ.

තත්‍ථ **මෙථුනන්ති** ඉදං තාව පඨමපාරාජිකං නාම සමුට්ඨානසීසං. සෙසානි තෙන සදිසානි. **තත්‍ථ**-ඒ **සමුට්ඨානසීසේ** යෙහි; **සුක්කසංසග්ගාති** සුක්කවිසර්ගය ද, කායසංසර්ගය ද, **අනියතෙ පඨමෙ**-පළමු වන අනියතශික්ෂාපදය ද, **ඤත්තිපරියාපන්නාති** "ජානං පුබ්බූපගතං භික්ඛුං" යන ශික්ෂාපදය ද, භික්ඛුනීපරිපාවිතපිණ්ඩපාතශික්ෂාපදය ද; **රහො නිසජ්ජා භික්ඛුනියා සහාති** "භික්ඛුනියා සද්ධිං රහො නිසජ්ජං" යන ශික්ෂාපදය ද;

සභොජනෙ රහො මෙවාති "සභොජනෙ කුලෙ අනුප ඛජ්ජ නිසජ්ජ ශික්ෂාපද රහොනිසජ්ජශික්ෂාපදයෝ දෙදෙන ද; **අඞ්ගුලි උදකෙ හසනති** අඞ්ගුලිපතොදකය ද, උදකෙ හසන ධම්ම ශික්ෂාපදය ද; **පහාරෙ උගගිරෙ** වෙවාති පහාරදානශික්ෂා පදය ද, තලඝාතිකඋගගිරණශික්ෂාපදය ද; **තෙපඤ්ඤා ච සෙඛියාති** පරිමණ්ඩලනිවාසනාදි වූ බුදුකවණ්ණනාවසයෙන් කියනලද තෙපණස් සෙඛිය ශික්ෂා පදයෝ ද;

අඛකඛකං ගාමවඤ්ඤුනාති භික්ෂුණීන්ගේ අඛකඛකශික්ෂා පදය ද, ගාමන්තගමනශික්ෂාපදය ද, අවඤ්ඤුතඤ්ඤ හත්ථතො ඛාදනීයගහණශික්ෂාපදය ද; **තලමට්ඨඤ්ච සුඛිකාති** තලඝා තක ය, ජතුමට්ඨක ය, උදකසුඛිත ය යන ශික්ෂාපද තුණ ද; **වඤ්ඤං වුත්තාව**-"ඡපඤ්චයොජනානි"යන ශික්ෂාපදය ද, ඔවාදය අගමනශික්ෂාපදය ද;

ඉමේ සික්ඛාති ඉමා සික්ඛායෝ යි ලිඞ්ගවිපරියය **කරණ ලදී. කායමානසිකා කතාති** කායචිත්තසමුට්ඨානයෙන් කරණ ලදහු.

අදිණ්නන්ති ඉදං තාව අදින්නාදානන්ති වා දුතියපාරාජී කන්ති වා එකං සමුට්ඨානසීසං. සෙසානි තෙන සදිසානි. **තත්ථ-ඒ අදින්නාදානසමුට්ඨාන ය‍ෑ යි ද දුතියපාරාජිකසමුට්ඨාන ය‍ෑ යි ද කියනලද අදින්නාදානසමුට්ඨානසීසයෙහි;** මේ ප්‍රධාන කොට මේ හා **සමුට්ඨාන කියම්හ** යි සේසි. **විඤ්ඤත්තිනති** මනුස්සවිඤ්ඤත්ති ය‍ෑ උත්තරිමනුස්සධම්ම ය‍ෑ යන ශික්ෂාපද දෙක ද; **දුට්ඨුල්ල අනත්තකාමතාති** දුට්ඨුල්ලවාචා ය‍ෑ අත්තකාමපාරිචරියා ය‍ෑ යන ශික්ෂාපද දෙක ද; **අමූලා අසඤ්ඤභාගියාති අමූලඅසඤ්ඤභාගිය** ශික්ෂාපදයෝ දෙදෙන ද; **අනියතා දුනි සික්ඛාති** විනියානියත ශික්ෂාපදය ද;

අචජ්ජෙ පරිණාමනෙති "සාමං චීවරං දත්වා අච්ඡින්දෙය්‍ය," "ඤාතං සඞ්ඝිකං ලාභං පරිණතං අත්තනො පරිණාමෙය්‍ය" යන මෙ දෙ ශික්ෂාපදය ද; **මුසාඔමසපෙසුඤාති** මුසාවාදශික්ෂා පදය ද, ඔමසවාදශික්ෂාපදය ද, භික්ඛුපෙසුඤ්ඤශික්ෂාපදය ද; **දුට්ඨුල්ලා පඨවිං ඛණෙති** දුට්ඨුල්ලාපත්තිආරොචනශික්ෂාපදය ද, පඨවිඛණනශික්ෂාපදය ද; **භූතං අසඤ්ඤුඛ උජ්ඣාපෙති** භූත ගාමසීඛය ද, අසඤ්ඤවාදසීඛය ද, උජ්ඣාපනසීඛය ද;

නිකඩ්ඪනං සිඤ්චනඤ්චාති විහාරනිකඩ්ඪනසීඛය ද, සපපාණෙදකයෙන් තිණාදිසිඤ්චනසීඛය ද; **ආමිසහෙතු භුත්තාවිනති** "ආමිසහෙතු භික්ඛූ භික්ඛුනියො ඔවදන්ති" යන සීඛය ද, "භුත්තාවිං පවාරිතං අත්තරිත්තෙන ඛාදනීයෙන" යනාදීන් පවාරණසීඛය ද; **එහි අනාදරියඤ්ඤාති** "එහා වුසො ගාමං වා" යනාදි සීඛය ද, අනාදරිය සීඛය ද, භිංසාපනසීඛය ද; **අපනිඛෙ ච ජීවිතන්ති** පත්තාදීනං අපනිධාන සීඛය ද, සඤ්චිච්ච පාණං ජීවිතා වොරොපණ සීඛය ද;

ඤාතං සපපාණකං තම්මන්ති "ඤාතං සපපාණකං උදකං පරිභුඤ්ජෙය්‍ය" යන සීඛය හා පුනකම්මාය උක්කොටනසීඛය ද; **ඌනපඤ්චවාස නාසනාති** "ඌනවීසතිවස්සං" යන සීඛය හා "ඤාතං තථාවාදිනා" යන උක්ඛිත්තයා හා සංවාස සීඛය ද, නාසිතසාමණෙරසමොධානසීඛය ද; **සහධම්මිකං විලෙඛා වාති** "භික්ඛුහි සහධම්මිකං වුච්චමානො" යන සීඛය හා "විලෙඛාය සංවත්තන්ති" යන සීඛය ද; **මොහනා අමූලකෙන චාති** "මොහනකෙ පාචිත්තියං" යන සීඛය ද, "අමූලකෙන සඞ්ඝාදිසෙසෙන අනුද්ධංසෙය්‍ය" යන සීඛය ද;

කුසකුවවං ඩිඝනං දදාති කුසකුවවුපපාදනසිඛය හා "ධම්මිකා නං කම්මානං ඡන්දං දත්වා ඩිඝන" සිඛය ද; **පරිණාමෙය්‍ය පුග්ගලෙති** "සඞ්ඝිකං ලාභං පරිණතං පුග්ගලස්ස පරිණාමෙය්‍ය" යන සිඛය ද; **කිත්තෙන අකාලං අවජ්ජෙතෙති** "කිත්තෙන අය්‍යෝ එසෝ පුරිසපුග්ගලෝ කරිස්සති" යන සිඛය හා "අකාලචීවරං කාලචීවරන්ති අධිට්ඨහිත්වා භාජාපෙය්‍ය" යන සිඛය හා "භික්ඛුනියා සඞ්ඝිං චීවරං පරිවත්තෙත්වා අවජ්ජෙය්‍ය" යන සිඛය ද; **දුග්ගහිං නිරයෙන වාති** "දුග්ගහිතෙන දුපධාරිතෙන පරං උජ්ඣාපෙය්‍ය" යන සිඛය හා "නිරයෙන වා බ්‍රහ්මචරියෙන වා අභිසපෙය්‍ය" යන සිඛය ද;

ගණං විභඞ්ගං දුබ්බල්‍යන්ති "ගණස්ස චීවරලාභං අන්තරා යං කරෙය්‍ය" යන සිඛය හා "ධම්මිකං චීවරවිභඞ්ගං පට්ඨා පෙය්‍ය" යන සිඛය හා "දුබ්බලචීවරපච්චාසාය චීවරකාලසමයං අතික්කාමෙය්‍ය" යන සිඛය ද; **කඨිනාඵාසුපච්චත්ථාති** "ධම්මිකං කඨිනුද්ධාරං පට්ඨාපෙය්‍ය" යන සිඛය හා "භික්ඛුනියා සඞ්ඝිච්ච අඵාසුං කරෙය්‍ය" යන සිඛය හා "භික්ඛුනියා කුපිතා අනත්තමනා භික්ඛුඤ්ඤෙය්‍ය වා" යන භික්ඛුනූපස්සයෙන් භික්ඛුඤ්ඤනසිඛය ද; **අකෙකාසමණ්ඩිමවජ්ජරීති** "භික්ඛුං අකෙකාසෙය්‍ය වා පරිභාසෙය්‍ය වා" යන සිඛය හා "වණ්ඩිකතා ගණං පරිභාසෙය්‍ය" යන සිඛය හා "කුලමවජ්ජරිනී අස්ස" යන සිඛය ද; **ගබ්භිනී ච පායන්තිඤාති** "ගබ්භිනිං වුට්ඨාපෙය්‍ය" යන සිඛය හා "පායන්තිං වුට්ඨාපෙය්‍ය" යන සිඛය ද;

මෙ වස්සා සික්ඛාසඣ්ඤනාති "මෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං සික්ඛමානං වුට්ඨාපෙය්‍ය" යන සිඛය හා "සික්ඛිත සික්ඛං සික්ඛමානං සඣ්ඤන අසම්මතං වුට්ඨාපෙය්‍ය" යන (දෙ) සිඛය ද; **ඌනෙ වෙව ගිහිගතාති** "ඌනවාදසවස්සං ගිහිගතං" යන සිඛය හා "පරිපුණ්ණවාදසවස්සං ගිහිගතං මෙ වස්සානි ඡසු ධම්මෙසු අසික්ඛිතසික්ඛං" යන සිඛය ද, "මෙ වස්සානි ඡසු ධම්මෙසු සික්ඛිතසික්ඛං සඣ්ඤන අසම්මතා" යන (තුන්) සිඛය ද; **කුමාරීභූතා නියෙසා චාති** "ඌනවීසතිවස්සං කුමාරීභූතං" යනාදීන් කියනලද තුන් සිඛය ද **ඌනවාදසසම්මතාති** "ඌන වාදසවස්සා වුට්ඨාපෙය්‍ය" යන සිඛය හා "පරිපුණ්ණ වාදසවස්සා සඣ්ඤන අසම්මතා වුට්ඨාපෙය්‍ය" යන (දෙ) සිඛය ද;

අලත්තාව සොකාවස්සනති "අලත්තාව තෙ අය්‍යෙ වුට්ඨා පිතෙන" යන සිඛය ද, "සොකාවස්සං සික්ඛමානං වුට්ඨාපෙය්‍ය" යන (දෙ) සිඛය ද; **ඡඩ්ඩුඅනුවස්සා ච මෙති** "පාරිවාසිකඡන්ද

දූතෙන සික්ඛමානං වුට්ඨාපෙය්‍ය" යන සිඛය හා "අනුවස්සං වුට්ඨාපෙය්‍ය" යන සිඛය හා "එකං වස්සං වේ වුට්ඨාපෙය්‍ය" යන (තුන්) සිඛය ද; **සමුට්ඨානා තිකා තතියාති** අදිනනාදාන සමුට්ඨාන නම් වූ මේ යථොක්ත ශික්ෂාපදයෝ තිසමුට්ඨානයහ යි එක් කරණලදහු.

සඤ්චරි කුටිවිහාරෙති සඤ්චරිත්තසිඛය හා "සඤ්ඤ චිකාය කුටිං කාරෙය්‍ය" යන සිඛය හා "මහල්ලකං විහාරං කාරෙය්‍ය" යන තුන්) සිඛය ද; **ධොවනඤ්ච පටිග්ගහෙතාති** "අඤ්ඤතිකාය භික්ඛුනියා පුරාණචීවරං ධොවාපෙය්‍ය" යන සිඛය ද, එසේ මැ පටිග්ගහණසිඛය ද; **විඤ්ඤාපනතුනනාදි අභිහට්ඨුන්ති** "අඤ්ඤතකං ගහපතිං චීවරං විඤ්ඤාපෙය්‍ය" යන සිඛය හා "බහූනි චීවරෙහි අභිහට්ඨුං පවාරෙය්‍ය" යන සිඛය ද; **ඵලිතනං දූතඤ්ඤ චාති** "චීවරවෙතාපන්නං උපනික්ඛිවං හොති" යන ශික්ෂාපද දෙක ද, "දූතෙන චීවරවෙතාපන්නං පහිණෙය්‍ය" යන සිඛය ද;

කොසියං සුඛමෙනාගා ඡබ්බස්සානි නිසිදනනති 'කොසිය මිස්සකං සන්තං" යනාදි ශික්ෂාපද පස ද; **රිඤ්චනති රූපියා ඡෙවාති** භික්ෂුවිභඞ්ගයෙහි "රිඤ්චනති උද්දෙසං" යි ආ එළක ලොමඩොවාපන සිඛය හා රූපියපටිග්ගහණ සිඛය ද; **ඵෙතා නානප්පකාරකාති** රූපියසංවොහාරය හා කයවික්කයසිඛය ද;

ඌනඛඛිනවස්සිකාති "ඌනපඤ්චබන්ධනෙන පත්තෙන" යන සිඛය හා වස්සිකසාටිකසිඛය ද; **සුත්තං විඤ්ඤාපෙත්වා චාති** "සුත්තං විඤ්ඤාපෙත්වා චීවරං වායාපෙය්‍ය" යන සිඛය හා "තන්තවායෙ උපසඞ්කමිත්වා චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය" යන සිඛය ද; **මාරුතා සිබ්බනී චාති** "යාවචාරකොසා අග්ගළඵ පනාය" යන සිඛය හා "අඤ්ඤතිකාය භික්ඛුනියා චීවරං දදෙය්‍ය" යන සිඛය හා "චීවරං සිබ්බෙය්‍ය" යන (තුන්) සිඛය ද; **පුබ්බවස්ස ජානි චාති** "පුබ්බෙහි වා මඤ්ඤෙහි වා" යන සිඛය හා චාතුමාස පච්චයපවාරණසිඛය හා "ජෝතිං සමාදහෙය්‍ය" වා යන (තුන්) සිඛය ද;

රතනං සුචි මණිඤ්ච වා තූලං නිසීදනඤ්ඤ ච-වස්සිකා ච සුගතෙනාති රතනසිඛය හා සූචිඝරශික්ෂාපදාදි වූ සත් සිඛය ද; **විඤ්ඤාතනි අඤ්ඤාවචනනා.**

සඞ්ඝිකා මහාජනි මෙ සූත්‍රයෙලා ගරුතො ලහුති "යා පන භික්ඛුනී අඤ්ඤං විඤ්ඤාපෙත්වා අඤ්ඤං විඤ්ඤාපෙය්‍ය" යනාදි

වූ ශික්ෂාපදයෝ නවදෙන ද; **මෙ විඤ්ඤාසා සාථිකා වා**ති "උච්චාරං වා පස්සාවං වා **සඞ්කාරං** වා විඤ්ඤාසං වා තිරොකුඩ්ඩෙ වා" යනාදි සිඛය හා "හරිතෙ ඡඩ්ඩෙය්‍ය වා ඡඩ්ඩාපෙය්‍ය වා" යන සිඛය ද, උදකසාථිකසිඛය ද; **සමණචීවරෙන වා**ති "**සමණචීවරං** දදෙය්‍ය" යන සිඛය ද;

භෙදනුවත්තනදුබ්බචදුස්සදුට්ඨුල්ලදිසි වාති සඞ්ඝභෙදසිඛය හා භෙදානුවත්තනසිඛය හා දුබ්බචසිඛය හා කුලදූසකසිඛය හා දුට්ඨුල්ලපටිචොදනසිඛය හා දිට්ඨිඅපපටිනිස්සජ්ජනසිඛය ද; **ඡන්දං උජ්ජඟ්ගිකා මෙ වා**ති "ඡන්දං අදත්වා උඨායාසනා" යන සිඛය හා උජ්ජඟ්ගිකාය අනන්තරඝරෙ ගමනනිසීදන දෙ සිඛය ද; **මෙ ච සඤ්ඤි**ති "අපපසද්දො අනන්තරඝරෙ ගමිස්සාමි, නිසීදිස්සාමි" යන දෙ සිඛය ද; **න ව්‍යාහරෙති** "න සකබලෙන මුඛෙන ව්‍යාහරිස්සාමි" යන සිඛය ද; **ඡමා නිවාසනෙ ඨානං පච්ඡතො උපපථෙන වා**ති "ඡමාය නිසීදිත්වා, නීචෙ ආසනෙ නිසීදිත්වා, සීතෙ නිසින්නස්ස, පච්ඡතො ගච්ඡන්තෙ පුරතො ගච්ඡන්තස්ස, උපපථෙන ගච්ඡන්තෙ පථෙන ගච්ඡන්තස්ස යන මෙතෙක් සිඛය ද; **වජ්ජානුවත්තිඝහණාති** වජ්ජපටිචොදනය හා උක්කිත්තානුවත්තනසිඛය හා හත්ථග්ගහණාදිසඞ්ඛ්‍යාත වූ තුන් පාරාජිකා සිඛයෝ ද; **ඔසාරෙ පවාරිකඛණාති** "අනපලොකෙත්වා කාරකසඞ්ඝං අනඤ්ඤාය ගණස්ස ඡන්දං ඔසාරෙය්‍ය" යන සිඛය හා 'බුද්ධං පච්චාරිකඛාමි" යනාදි සිඛය ද,

කිස්මිං සංසට්ඨා මෙ වඩ්ඪිති "කිස්මිංවිදෙව අධිකරණෙ පච්චාකතා" යන සිඛය හා "භික්ඛුනියො පනෙව සංසට්ඨා විහරන්ති" යන සිඛය හා "යා පන භික්ඛුනී එවං වදෙය්‍ය සංසට්ඨාව අය්‍යෙ තුමෙහ විහරථ" යන සිඛය හා "අන්තානං වඩ්ඪිත්වා වඩ්ඪිත්වා" යන මෙතෙක් සිඛයෝ ද; **චිඝිබ්බෙ දුක්කිතාය වා**ති "භික්ඛුනියා චීවරං චිඝිබ්බෙත්වා වා චිඝිබ්බාපෙත්වා වා" යන සිඛය හා "දුක්කිතං සහජීවිනිං"යන(දෙ)සිඛයද; **පුන සංසට්ඨා න වූපසමෙති** "සංසට්ඨා විහරෙය්‍ය ගහපතිනා වා ගහපතිපුත්තෙන වා" ති එවං පුන වුත්තසංසට්ඨසිඛය හා "එතස්‍ය ඉමං අධිකරණං වූපසමෙතීති වුච්චමානා" යන (දෙ) සිඛය ද; **ආරාමඤ්ච පවාරණාති** "ඡාතං භික්ඛුනං ආරාමං" යන සිඛය හා "උභතො සඞ්ඝෙ තීහි ඨානෙහි නපපවාරෙය්‍ය" යන (දෙ) සිඛය ද;

අඩ්ඪඛං සහජීවි මෙති "අඩ්ඪමාසං භික්ඛුනියා භික්ඛුසඞ්ඝතො" යන සිඛය හා "සහජීවිනිං වුට්ඨාපෙත්වා වෙ වස්සානි නෙව අනුඤ්ඤාණෙතබ්‍බය" යන සිඛය හා "සහජීවිනිං වුට්ඨාපෙත්වා නෙව

වූපකාසෙය්‍ය" යන (දෙ) සිඛය ද; **චීවරං අනුබන්ධිනාති** "සචෙ මෙ ත්වං අය්‍යෙ චීවරං දස්සසි" යනාදි සිඛය හා "සචෙ මෙ ත්වං අය්‍යෙ වෙ වස්සානි අනුබන්ධිස්සසි" යන (දෙ) සිඛය ද;

උබහතො කඨිනං ඵාණෙති "නිට්ඨිතචීවරස්මිං පන භික්ඛුනා උබහතස්මිං කඨිනෙ" යනාදීන් කියනලද තුන් **ශික්ෂාපදය ද; පරමං පතතභෙසජ්ජනති** "දසාහපරමං අතිරෙකපත්තො" යන සිඛය හා "පටිසාඝනීයානි භෙසජ්ජානි" යන (දෙ) සිඛය ද; **අචෙවකං වාපි සාඝඛකනති** අචෙවකචීවරසිඛය හා එයට එක්ඛිති වැකි සාඝඛකසිඛය ද; **පකඛමනෙනන වා දුවෙති** "තං පකඛමනෙතා නෙව උඩරෙය්‍ය" යි එන තැනැ කී දෙ සිඛය ද;

උපඤ්ඤං පරම්පරනති "භික්ඛුනූපස්සයං උපසඞ්කමිත්වා භික්ඛුනියො ඔවදෙය්‍ය" යන සිඛය හා "පරම්පරභොජනෙ පාචිත්තියං" යන සිඛය ද; **අනතිරිත්තං නිමන්තනානති** "අනතිරිත්තං ඛාදනීයං වා" යන සිඛය හා "නිමන්තිතො සහත්තෙතා සමානො" යන දෙ සිඛය ද; **විකපපං රකෙඛ්ඛ, විකාලෙති** "සාමං චීවරං විකපෙත්වා" යන සිඛය හා "රකෙඛ්ඛු ඛත්තියස්ස" යන සිඛය හා "විකාලෙ ගාමං පවිසෙය්‍ය" යන (තුන්) සිඛය ද; **වොසාසාරක්ඛකෙසන වානි** "වොසාසමානරූපා ඨිතා" යන සිඛය හා "තථාරූපෙසු ආරඤ්ඤකෙසු සෙනාසනෙසු" යන පුබබ අපපටිසංවිදිතසිඛය ද;

උස්සහා සනනිවාසෙඛ්වානි "උස්සහවාදිකා විහරෙය්‍ය" යන සිඛය හා "පත්තසන්නිවාසං කරෙය්‍ය" යන දෙ) සිඛය ද; **පුරෙ පචජා විකාලෙ වානි** "යා පන භික්ඛුනී පුරෙභත්තං කුලානි උපසඞ්කමිත්වා" යන සිඛය හා "පච්ඡාභත්තං කුලානි උපසඞ්කමිත්වා" යන සිඛය හා "විකාලෙ කුලානි උපසඞ්කමිත්වා" යන (තුන්) සිඛය ද; **පඤ්චාහිකා සඞ්කමන්ති** "පඤ්චාහිකං සඞ්ඝාවිවාරං අතික්කාමෙය්‍ය" යන සිඛය හා "චීවරං සඞ්කමනීයං ධාරෙය්‍ය" යන (දෙ)සිඛය ද; **දුවෙ ආවසථෙන වානි** "ආවසථචීවරං අනිස්සජ්ජිත්වා පරිභුඤ්ජෙය්‍ය" යන සිඛය හා "ආවසථං අනිස්සජ්ජිත්වා චාරිකං පක්කමෙය්‍ය" යි මෙසේ **ආවසථය** හා සමඟ කියනලද දෙ සිඛය ද;

පසාඛෙ ආසනෙ වෙවානි "පසාඛෙ ජාතං ගණ්ඩං වා" යන සිඛය හා "භික්ඛුස්ස පුරතො අනාපුච්ඡා ආසනෙ නිසීදෙය්‍ය" යන (දෙ)සිඛය ද;

එළකලොමා වෙ සෙය්‍යානි එළකලොමසිඛය හා අනුපසම්පන්න මාතුගාම දෙදෙනා හා **සහසෙය්‍ය** දෙ සිඛය ද; **ආහවව පිණ්ඩභොජනනති** ආහවවපාදසිඛය හා **ආවසථපිණ්ඩ**

භොජනසිඛය ද; **ගණං විකාලෙ සන්නිධිනති** ගණභොජන සිඛය හා විකාලභොජනසිඛය හා සන්නිධිකාරසිඛය හා තුන් සිඛය ද; **දන්තපොඤ්ඤනවෙලඤ්ඤාති** දන්තපොනසිඛය හා අවෙලකසිඛය ද;

උය්‍යුත්තං වසෙ උය්‍යොධිති "උය්‍යුත්තං සෙනං දස්සනාය" යන සිඛය හා "සෙනාය වසෙය්‍ය" යන සිඛය හා "උය්‍යොධිකං වා-පෙ-අනීකදස්සනං වා ගවෙජ්ඡය්‍ය" යන මේ තුන් සිඛය ද;

සුරා ඔරෙ නහාපනාති සුරාපානසිඛය හා 'ඔරෙනඩමාසං නහාපෙය්‍ය" යන (දෙ) සිඛය ද; **දුබ්බණ්ණා මෙ දෙසනිකාති** "තිණ්ණං දුබ්බණ්ණකරණානං" යන සිඛය හා "අන්තරකරං පවිඨාය හත්ථතො" යන සිඛය හා "සෙඛසම්මතානි කුලානි" යන උභතොවිභඞ්ගපාවිදෙසනීයවය්‍යය ද; **ලසුනඤ්ඤනතිඛඤ්ඤනවමනාති** ලසුනසික්ඛාපදය හා "භික්ඛුස්ස භුඤ්ජන්තස්ස පානීයෙන වා විධූපනෙන වා"යන සිඛය හා "නවවං වා ගීතං වා වාදිතං වා දස්සනාය" යන සිඛය ද;

ඉතො පරං පාළිං විරජ්ඣිත්වා ලිඛන්ති. යථා පන අත්ථං වණ්ණයාම, එවමෙත්ථ අත්ථො වෙදිතබ්බො.

නහානං අත්ථරණං සෙය්‍යන්ති "නහානං නහායෙය්‍ය" යන සිඛය හා "එකත්ථරණපාපුරණා තුවට්ටෙය්‍යුං" යන සිඛය හා "එක මඤ්ඤෙව තුවට්ටෙය්‍යුං" යන (තුන්)සිඛය ද; **අඤ්ඤාරඤ්ඤෙ සථා බඛිති** "අඤ්ඤාරඤ්ඤෙ සාසඛකසම්මතෙ" යන සිඛය හා එසේ ම "බඛිරඤ්ඤෙ[1]" යන සිඛය ද; **අඤ්ඤාවසසං චිත්තාගාරන්ති** "අඤ්ඤාවසෙස චාරිකං පක්කමෙය්‍ය" යන සිඛය හා "රාජාගාරං වා චිත්තාගාරං"වා යන සිඛය ද; **ආසන්දිං සුත්තකඤ්ඤනන්ති** "ආසන්දිං වා පල්ලඞ්කං වා" යන සිඛය හා "සුත්තං කන්තෙය්‍ය" යන මේ (දෙ) සිඛය ද;

වෙය්‍යාවච්චං සහත්ථා වාති"ගිහිවෙය්‍යාවච්චං කරෙය්‍ය" යන සිඛය හා "අගාරිකස්ස වා පරිබ්බාජකස්ස වා පරිබ්බාජිකාය වා සහත්ථා ඛාදනීයං වා භොජනීයං වා දදෙය්‍ය" යන මෙ (දෙ) සිඛය ද; **අභික්ඛුකාවාසඤ්ඤන වාති** "අභික්ඛුකෙ ආවාසෙ වස්සං වසෙය්‍ය"ති ඉදමෙතං සන්ධාය වුත්තං. **ජතුං යානඤ්ච සඛාණිති** "ජතුනුපාහනං ධාරෙය්‍ය" යන සිඛය හා "යානෙන යායෙය්‍ය" යන සිඛය හා "සඛාණිං ධාරෙය්‍ය" යන මෙ (තුන්) සිඛය ද; **අලඞ්කාරං ගණ්ඨවාසිකන්ති** "ඉත්ථලඞ්කාරං ධාරෙය්‍ය" යන සිඛය හා "ගණ්ඨවණ්ණකෙන නහායෙය්‍ය" යන සිඛය හා "වාසිතකෙන පිඤ්ඤකෙන නහායෙය්‍ය" යන මෙ (තුන්) සිඛය ද;

---

1. නිත්‍ය රථෙඛ-පාතිමොඤ්ඛ.

භික්ඛුනියාති ආදිනා "භික්ඛුනියා උම්මද්දනපෙය්‍ය වා" යනා දින් කියනලද ශික්ෂාපදයෝ සතරදෙන ද; **අසඞ්කච්චිකා ආපත්තීති** "අසඞ්කච්චිකා ගාමං පවිසෙය්‍ය පාචිත්තියං" යි මෙසේ කියනලද්දාවූ ආපත්ති ද; **චත්තාරීසා චතුත්තරීනති** මේ සියලු සුභාෂිත් ශික්ෂාපදයෝ;

කායෙන න වාචාචිත්තෙන කායචිත්තෙන න වාචතොති කායෙන චෙව කායචිත්තෙන ච සමුට්ඨහනති, න වාචාචිත්තෙන න වාචතොති අත්ථො. කයින් කායචිත්තයෙනුදු උපදනාහ, වාචාචිත්තයෙන් ද වචසින් ද නො උපදනාහ යි සේයි. **මෙ සමුට්ඨානිකා සඞ්ඛ සමා එලකලොමකාති** යන මෙ අගමහිර වූ අර්ථ ඇත්තේ මෑ යි.

පදං අසද්ධම්මනාති පදසොධම්මයිඛය හා "මාතුගාමස්ස උත්තරිං ඡප්පඤ්චවාචාහි ධම්මං දෙසෙය්‍ය අසද්ධම්ම විඤ්ඤූනා පුරිසවිඤ්ඤහෙන" යන සිඛය හා "අසම්මතො භික්ඛුනියො ඔවදෙය්‍ය" යන මේ තාක් ශික්ෂාපදයෝ ද; **තථා අට්ඨඞ්ගෙන වාති** "අට්ඨඞ්ගතෙ සුරියෙ ඔවදෙය්‍ය"ති ඉදමේතං සඞ්ඛ්‍යය වුත්තං. **තිරච්ඡානවිජ්ජා මෙති** "තිරච්ඡානවිජ්ජං පරියාපුණෙය්‍ය," "වාචෙය්‍ය" යන දෙ සිඛය ද; **අනොකාසෙ ච පුච්ඡනාති** "අනොකාසකතං භික්ඛුං පඤ්හං පුච්ඡෙය්‍ය"ති ඉද මේතං සඞ්ඛ්‍යය වුත්තං.

අඛානං නාවා පණ්ණනති "භික්ඛුනියා සඞ්ඝං සංවිධාය එකඛානමගඝං" යන සිඛය හා "එකං නාවං අභිරුහෙය්‍ය" යන සිඛය හා "පණීතභොජනානි අත්තනතො අත්ථාය" යන සිඛය හා තුන් සිඛය ද; **මාතුගාමෙන සංහරෙති** "මාතුගාමෙන සඞ්ඝං සංවිධාය" යන සිඛය ද, "සම්බාධෙ ලොමං සංහරාපෙය්‍ය" යන මේ (දෙ) සිඛය ද; **ඛණ්ඩං නිමන්තිතා වෙවාති** "ඌමකඛණ්ඩං විඤ්ඤූපෙත්වා" යන සිඛය හා "නිමන්තිතා වා පවාරිතා වා ඛාදනීයං වා භොජනීයං වා" යන (දෙ) සිඛය ද; **අට්ඨ වාති** භික්ඛුනීන්ට කියනලද අෂ්ට පාටිදෙසනීයයෝ ද;

ථෙය්‍යසත්ථං උපස්සුතිනති "ථෙය්‍යසත්ථෙන සඞ්ඝං සංවිධාය එකඛානමගඝං" යන සිඛය හා "උපස්සුතිං තිට්ඨෙය්‍ය" යන සිඛය ද; **සූපං විඤ්ඤූපනෙන චාති** යන මෙ සෙඛියයෙහි සූපොදනවිඤ්ඤත්තිය සඳහා කියනලදී. **රතනිවජ්ඣතා ච ඔකා**

සහති "රත්තන්ධකාරෙ අපපදීපෙ" යන සිඛය හා "පටිච්ඡන්නෙ ඔකාසෙ" යන සිඛය හා "අජ්ඣොකාසෙ පුරිසෙන සඞ්ගං" යන සිඛය හා යන තුන් සිඛය ද; **වුත්තෙන සහතමාති** "රථිකාය වා වුත්තෙ වා" යනාදීන් කියනලද මේ ශික්ෂාපදය සත් වනු කොට ඇති; **එසෙ**-මේ ශික්ෂාපදයෝ;

කායවිත්තෙනෙව ජායන්ති-කායචිත්තයෙන් වෙති. **සෙ**-ඔහු; **වාචසො න ජායන්ති**-කයින් වෙති. **තීහි මාරෙහි ජායන්ති**-කාය වාචා චිත්ත ය යන තුන් දෙරින් වෙති. **ඉමෙ ථෙය්‍ය සත්ථසමුට්ඨානා**-මේ ථෙය්‍යසත්ථසමුට්ඨානයෝ; **ඡ ඉම සමුට්ඨානිකා**-ඉසමුට්ඨානිකයහ යි; **ආදිචඛඛඬ්ගා** දෙසිතා.

එකාදස අනූනකා-අනූන් වූ මේ එකොළොස් ධර්ම දෙසන සිඛය ද; **වාචාවිත්තෙනෙව ජායන්ති**-වාවාචිත්තයෙන් වෙති. **සෙ**-ඔහු; **කායසඤ්ඤා න ජායන්ති**-කයින් නො වෙති. **සඛඛ**-මොහු හැමදෙන; **එකසමුට්ඨානා**-එකසමුට්ඨානයහ. **සමඤ්ඤා ධම්ම දෙසනා**-ධර්මදේශනාසමුට්ඨානය හා සමයෝ යි.

භූතං-භූතාරොචනය; **කායෙන ජායති**-කයින් වෙයි. **න වාචා න ච චිත්තතො**-වාවාචිත්තයෙන් නො වෙයි. **වාචතො ච සමුට්ඨාති**-වාචායෙන් වෙයි. **න කායා න ච චිත්තතො**-කාය චිත්තයෙන් නො වෙයි.

කායවාචාය ජායති-කායවාචායෙන් වෙයි. **තං**-එ; **චිත්තතො න ජායති**-සිතින් නො වෙයි. **භූතාරොචනකා නාම**-භූතාරොචන නම් ආපත්ති ය; **තීහි ඛාසෙහි ජායති**-කායො වාචා කායවාචා යන තුන් කාරණයෙන් වෙ.

චොරී-චොරී සමුට්ඨාපනය; **වාචාය චිත්තෙන**-වාවාචිත්ත යෙන් වෙයි. **කායතො**-කයින්; **න තු ජායති**-නොවෙයි. **ජායති තීහි මාරෙහි**-කායවාවාචිත්තයෙන් වෙයි. **ඉදං චොරිවුට්ඨාපනං**-මේ චොරිවුට්ඨාපනය; **අකඛණ්ඩසමුට්ඨානං**-අඛණ්ඩව වූ සමුට්ඨානදෙකක් ඇත්තේ; **ඛම්මරාජෙන භාසිතං**.

අනනුඤ්ඤාතං- "මාතාපිතූහි වා සාමිකෙන වා අනනුඤ්ඤාතං" යන සිඛය; **වාචාය**-වාචායෙන් වෙයි. **න කායා න ච චිත්තතො**-කාය චිත්තයෙන් නො වෙයි. **ජායති කායවාචාය**-කායවාචායෙන් වෙයි. **තං**-එ; **චිත්තතො**-සිතින්; **න ජායති**-නො වෙ.

ජානති වාවාවිතෙහාන-වංවාවිහතයෙන් වෙයි. **න තං ජානති කාශපෝ**-එ කසින් නො වෙයි. **ජානති තිහි මාරෙහි-කාශවංවාවිහත** යන තුණින් වෙයි. **අසමං චතුඛානිකං**-අසි නව වූ සතර සමුඛානයක් ඇත්තේ සි.

අසමෙමාහකරං ඛාහං-සමෙමාහ නො කිරීමට කාරණ වූ; **නෙතානිඛම්මානුලොමිකං**-විනයපාලිඅර්ථකථාවට අනු කොට; **දස තීණී**-තෙළෙස් වැදෑරුම් වූ සමුඛානකෙරෙකුන්; **සුදෙසයි**-භාග්‍යවත්තෙම මනා කොට දෙසී ය. **සමුඛානමයි**-සමුඛානයෙහි; **ඉමං සඞඛෙපං**-මේ සංක්ෂෙපය; **ධාරයෙහතා**-ධරන්නාවූ; **විසඤඤිපි**-නුවණැත්තේ ද; **සමුඛානෙ**-සමුඛාන යෙහි හෙවත් ශික්ෂාපතනිවාරණයෙහි; **න මුහෙති**-මුළා නො වෙ.

මෙ **පරිවාර** බලා දත යුතු.

කඩඛාවිතරණිපිටපොත

නිමි.